මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ඉතිහාසය | 8 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..........................................................................................................................

## I පත්‍රය

- ❖ **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**
- ❖ **01 සිට 20 දක්වා වූ ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න**

01 මෙරට ඓතිහාසික මූලාශ්‍ර වලට අනුව වැව් ඉදිකිරීමට මැදිහත් වූ පළමු රජු කවුද?

1 දේවානම්පියතිස්ස රජුය 2 වසභ රජුය
2 පණ්ඩුකාභය රජුය 4 මුටසිව රජුය

02 මයෙත් වැව නමින් හැඳින්වූ වැව වර්තමානයේ හඳුන්වන්නේ කුමන නමින්ද ?

1 මින්නේරිය වැව 2 මහවිලච්චිය වැව 3 මානන්කට්ටිය වැව 4 මහකනදරා වැව

03 මහා පරාක්‍රමබාහු රජතුමා ඉදිකරන ලද මහ වැව් සංඛ්‍යාව කොපමණද?

1 16 කි 2 29 කි 3 136 4 163

04 අඹන් ගඟ හරහා වේල්ලක් බැඳ ඉහළ ප්‍රදේශ වලට ජලය ගෙනයාමට වසභ රජු තනවන ලද ඇළ මාර්ගයක් වන්නේ,

1 තල්වතු ඇළ 2 යෝධ ඇළ 3 මිණිපේ ඇළ 4 ඇළහැර ඇළ

05 අධිපීඩනයක් සහිතව වැව තුළ පවතින ජලය වැව් බැම්ම හරහා ඇළ මාර්ග වලට ගැනීමට ඉදිකර ඇති නිර්මාණයකි

1 සොරොව්ව 2 බිසෝකොටුව 3 රළපනාව 4 පිටවාන

06 පහත A හී සඳහන් ඇළ මාර්ග ඉදිකළ රජවරු B තීරයේ දැක්වෙන අතර ඒවා එකිනෙක ගලපා නිවැරිදි පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| 1 ඇළහැර ඇළ | A ධාතුසේන රජු |
| 2 තල්වතු ඇළ | B පළමුවන අග්ගබෝධි රජු |
| 3 යෝධ ඇළ | C මහසෙන් රජු |
| 4 මිණිපේ ඇළ | D වසභ රජු |

1 CDBA 2 DCAB 3 DCBA 4 DACB

07 ස්වභාවික සුළං බලයෙන් උදුන්වල ගිනි දල්වා යකඩ නිස්සාරණය කළ ස්ථානයක් වන්නේ,

1 සීගිරිය දෙහිගහ ඇළකන්ද 2 බලංගොඩ සමනළවැව 3 ඉබ්බන්කටුව 4 ගල්කඩවල

08 රජරට ශිෂ්ටාචාරය සමයේ තිබූ ආරෝග්‍යශාලාවක නටබුන් දැකිය හැකි ස්ථානයකි ,

1 මිහින්තලය 2 අභයගිරිය 3 වෙස්සගිරිය 4 ඉසුරුමුණිය

09 මෙරට රජරට ශිෂ්ටාචාර සමයේ නිර්මානය කරන ලද බෝසත් ප්‍රතිමාවක් දැකිය හැකි ස්ථානයක් නොවන්නේ ?

1 රජගල 2 බුදුරුවගල
3 දඹේගොඩ 4 යටාලවෙහෙර

10 කෝට්ටේ රාජධානිය කෝට්ටේ, සීතාවක, රයිගම ලෙස කොටස් තුනකට බෙදෙන විට උඩරට සිටි පාලකයා වන්නේ,

1 I වන විමලධර්මසූරිය රජුය 2 II වන විමලධර්මසූරිය රජුය

3 සේනා සම්මත වික්‍රමබාහු රජුය 4 ජයවීර බණ්ඩාර රජුය

11 දළදා පෙරහැරට දේවාල පෙරහැර එක්කරමින් එය උත්කර්ෂවත්කිරීමට කටයුතු කළ රජු වන්නේ

1 ශ්‍රී වික්‍රම රාජසිංහ රජු 2 ශ්‍රී විජය රාජසිංහ රජු 3 කීර්ති ශ්‍රී රාජසිංහ රජු 4 ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

12 1815 සාර්ථක උඩරට ආක්‍රමණය මෙහෙය වූයේ,

1 රොබට් බ්‍රවුන්රිග් 2 තෝමස් මේට්ලන්ඩ් 3 ෆෙඩ්රික් නෝර්ත් 4 හෙන්රි වෝඩ්

13 උඩරට රාජධානියට ස්වභාවික වෙරළ තීරයක් අහිමි වූයේ කුමන වසරේ අත්සන් කරන ලද ගිවිසුමකින්ද ?

1 1638 2 1658 3 1733 4 1766

14 පහත A හා B යටතේ දක්වා ඇත්තේ පෘතුගීසි ජාතිකයන් විසින් උඩරට රාජධානියට එල්ල කළ ආක්‍රමණ කිහිපයක් සහ

ඒවාට නායකත්වය දුන් පෘතුගීසි සෙන්පතිවරුන්ය. නිවැරදි පිළිතුර ගලපන්න

| A | B |
|---|---|
| i දන්තුරේ සටන | P කොන්ස්තන්තිනු ද සා |
| ii ගන්නෝරුව සටන | Q දියෝගු ද මේලෝ කැස්ත්‍රෝ |
| iii රන්දෙනිවෙල සටන | R පේරෝ ලෝපේස් ද සූසා |

I PQR II RQP III QPR IV RPQ

15

| A | B |
|---|---|
| i පෘථිවිය ගෝලාකාර බව | A මයිකල් සර්ටේස් |
| iii දුරේක්ෂය | B නිකලස් කොපර්නිකස් |
| iii රුධිර සංසරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය | C ගැලලියෝ ගැලලි |
| iv ලෙඩරෝග සෑදීමට හේතු සහ ප්‍රතිකර්ම | D පැරසල්සස් |

1 CDAB 2 CBDA 3 BCDA 4 BCAD

16 ලියනාඩෝ ඩාවින්චිගේ තෙලිතුඩෙන් නිර්මානය වූවක් නොවන්නේ,

1 මොනාලිසා 2 අන්තිම රාත්‍රි භෝජනය 3 අවසාන විනිශ්චය 4 පර්වත මස්තකයේ දේව මෑණියෝ

17 මයිකල් ආන්ජිලෝ අතින් නිර්මානය වූ මූර්තියක් නොවන්නේ,

1 ශාන්ත ජෝන්ගේ ප්‍රතිමාව 2 පියෙටා ප්‍රතිමාව 3 ඩේවිඩ්ගේ ප්‍රතිමාව 4 මෝසෙස්ගේ ප්‍රතිමාව



❖ අංක 18 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා ලංකා සිතියම උපයෝගි කරගන්න

18 A අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති ඓතිහාසික නගරය කුමක් ද ?

1 අනුරාධපුරය 2 පොලොන්නරුව

3 මහනුවර 4 දඹදෙනිය

19 B අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති ගංගාව කුමක් ද ?

1 මල්වතු ඔය 2 කලා ඔය 3 කැළණි ගග 4 යාන් ඔය

20 C අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති වැව කුමක් ද ?

1 කලා වැව 2 යෝධ වැව

3 මින්නේරිය වැව 4 පරාක්‍රම සමුද්‍රය

(ලකුණු 2×20 - 40 )

## II පත්‍රය

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ**
- **අනිකුත් ප්‍රශ්න අතුරින් හතරකට පිළිතුරු සැපයිය යුතුය**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි**

01 පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙන් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න

A




(අ)i A පින්තූරයන් දැක්වෙන්නේ ඓතිහාසික ස්ථානය කුමක්ද?

ii මෙම නිර්මාණය කරවූ රජතුමාගේ නම ලියන්න.

iii මෙය කරවා ඇත්තේ කුමන යුගයකදී ද ?

iv මෙහි සැලසුමට සමාන ඉදිකිරීමක නටබුන් දැකිය හැකි ස්ථානයක් නම් කරන්න

B



(ආ) i B පින්තූරයන් දැක්වෙන්නේ කුමක් ද?

ii මෙම නිර්මාණය කරවූයේ කවුරුන් ද?

iii ඔහු විසින් නිර්මාණය කල වෙනත් ප්‍රතිමාවක් දක්වන්න

iv මෙම කාලයේ බහුලව ප්‍රතිමා නෙළන ලද්දේ කුමන අමුද්‍රව්‍යයක් භාවිත කරමින් ද ?

(ලකුණු 2 × 8 = 16 )

02 i මහසෙන් රජු විසින් තනවන ලදැයි සැළකෙන වැව් දෙකක් නම් කරන්න ( ලකුණු 02 )

ii විශාල වැව් තැනවීමෙන් ලංකිකයන් ලබා ගත් ජයග්‍රහණ දෙකක් ලියන්න ( ලකුණු 04 )

iii ඇළමාර්ග තැනවීමේදී ලාංකිකයන් මුහුණදුන් අභියෝග තුනක් දක්වා ඒවා ජය ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග කෙටියෙන් දක්වන්න ( ලකුණු 05 )

03 i මෙරට උයන් තැනවීමට මැදිගත් වු වෙනත් රජවරු දෙදෙනෙකු නම් කරන්න ( ලකුණු 02 )

ii පැරණි ජල උද්‍යාන වල කැපි පෙනෙන ලක්ෂණ 03 ක් දක්වන්න ( ලකුණු 04 )

iii සීගිරිය ජල උද්‍යානය ගැන වාක්‍ය පහක් ලියා දක්වන්න ( ලකුණු 05 )

04 i අනුරාධපුර යුගයේ අගනගර*යෙන් බැහැරව ඉදිකළ චෛත්‍ය දෙකක් දක්වන්න* ( ලකුණු 02 )

ii රජරට ශිෂ්ටාචාර සමයේ ඉදිකළ හිටි සහ හිඳි පිළිම 02 බැගින් සඳහන් කරන්න ( ලකුණු 04 )

iii දාගැබක ප්‍රධාන කොටස් නම්කරන්න ( ලකුණු 05 )

05 i උඩරට රාජ්‍ය හැදින්වූ නම් 02 ක් ලියන්න ( ලකුණු 02 )

ii පහත සඳහන් අය බෞතීස්ම ලැබීමෙන් පසු හැදින්වූ නම් මොනවාද?

A කුසුමාසන දේවිය B යමසිංහ බණ්ඩාර C කොනප්පු බණ්ඩාර ( ලකුණු 04 )

iii මහනුවර යුගයේ සමාජයේ කැපීපෙනෙන ලක්ෂණ කෙටියෙන් දක්වන්න ( ලකුණු 05 )

06 i කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් බුදු දහමේ දියුණුවට වූ සේවාවන් 02 ක් ලියන්න ( ලකුණු 02 )

ii මහනුවර යුගයේ චිත්‍ර කලාවේ ලක්ෂණ 04 ක් දක්වන්න ( ලකුණු 04 )

iii I වන විමලධර්මසූරිය රජුගෙන් ඉටුවූ දේශපාලන හා ආගමික සේවාවන් කෙටියෙන් පැහැදිලි කරන්න

( ලකුණු 05 )

07 i යුරෝපයේ පුනරුදය යනු කුමක්ද ? ( ලකුණු 02 )

ii 12 සහ 13 වන සියවස්වල යුරෝපයේ බිහිවූ විශ්වවිද්‍යාල 02 ක් නම්කරන්න ( ලකුණු 04 )

iii පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් දක්වන්න ( ලකුණු 05 )

08 i ලියනාඩෝ ඩාවින්චිගේ තෙලිතුඩින් නිර්මාණය වූ විශිෂ්ට නිර්මාණ දෙකක් දක්වන්න ( ලකුණු 02 )

ii පුනරුද සමයේ ඉතාලියේ සහ ප්‍රංශයේ සිටි ගත් කතුවරුන් දෙදෙනෙකු නම්කරන්න ( ලකුණු 04 )

iii පුනරුද සමයේ කලා ශිල්ප වල ලක්ෂණ තුනක් හා පුනරුදයට පෙර කලා ශිල්පවල ලක්ෂණ දෙකක් දක්වන්න

( ලකුණු 05 )